# බළන්ගොඩ නගර සභාව

## අභ්‍යන්තර ප්‍රතිපත්ති මාලාව



## සනීපාරක්ෂක සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය.

1- හැඳින්වීම

නගරසභා බලප්‍රදේශය තුල සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම හා කසල කළමනාකරණ කටයුතු වලට සම්බන්ධ වන සේවකයින් සනීපාරක්ෂක ගණයට ගැනේ. නගරසභා ආඥාපනතේ වගන්තිය අනුව බල ප්‍රදේශයේ සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම හා කසල කළමනාකරණ කටයුතු සිදුකිරීම නගරසභාවට පැවරී ඇත. ඒ අනුව පහත සඳහන් කාර්යන් සිදුකිරීමට සනීපාරක්ෂක සේවකයින් යෙදවීම සිදු කෙරේ.

i – නගරසභා බලප්‍රදේශයේ මන්මාවත් අතුගා පිරිසිදු කිරීම.

ii- නගරසභා බලප්‍රදේශයේ නිවාස වලින් ඉවත්කරන කසල එකතුකිරීම හා කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කිරීම.

iii- සියලුම කසල දිරන හා නොදිරන ලෙස වෙන් කිරීම හා දිරන කසල කොම්පෝස්ට් නිපදවීම සඳහා කටයුතු කිරීම

iv- නොදිරන කසල ප්‍රතිචක්‍රීය කටයුතු සිදුකිරීම

v- නගරයේ කානු පද්දතිය පිරිසිදු කිරීම.

vi- නගරයේ පොදුවැසිකිලි පිරිසිදු කිරීම හා ගලි බවුසර් සේවය සැපයීම.

2- සනීපාරක්ෂක සේවකයින්ගේ ආර්තික හා සමාජීය තත්වය

ඉහත සඳහන් සනීපාරක්ෂක කටයුතු සිදුකිරීම සඳහා යොදවා ඇති සේවකයින් ආර්තික තත්වය ඉතා අඩු මට්ටමක පවතින අතර ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ පෝෂන මට්ටමද ඉතා අඩු මට්ටමක පවතී. එසේම ඔවුන්ගේ අධ්‍යාපනයද ඉතා අඩු මට්ටමක පවතී.

3- සනීපාරක්ෂක සේවකයින් සඳහා දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

සනීපාරක්සක කටයුතු වලට යොදවා ගනු ලබන සේවකයින් සඳහා 6/2006 චක්‍රලේකය අනුව වැටුප් හා දීමනා ගෙවනු ලබන අතර අමතර රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් අතිකාල දීමනාද ගෙවනු ලබයි.

4- සභාව පාර්ෂවයෙන් කල යුතු අවශ්‍යතා

සනීපාරක්සක කටයුතු සිදු කිරීම නිසා අදාල සේවකයන්ට විවිධ රෝගාබාධ වැලදීම ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය වැඩිදියුනු කිරීම හා පෝෂන මට්ටම පවත්වාගෙන යාම සභාව විසින් කලයුතු යුතුකමක් වේ. එසේ කිරීම තුලින් ඔවුන්ගේ සේවය අකන්ඩව ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

5- ඉහත කාර්යය කිරීමේදී අනුගමනය කලයුතු නීතියේ අවශ්‍යතාවය

මේ සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබිය යුතුය. ඒ අනුව සහන සැලසීමට ගනු ලබන ක්‍රියා මාර්ග පලාත් පාලන කොමසාරිස් මගින් ගරු ඇමති තුමාගේ හෝ ගරු ආන්ඩුකාර තුමාගේ පූරව අනුමැතිය ලබාගත යුතුය.

6- කාර්යය හා සම්බන්ධ වන පාර්ෂව කරුවන්

i- නගරයේ මන්මාවත් පිරිසිදුකරන සේවකයින්
ii- නගරයේ කසල එකතුකරන හා ප්‍රවාහනය කරන සේවකයින්
iii- නගරයේ කානු පිරිසිදු කරන සේවකයින්
iv- කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කරන සේවකයින්
v- නගරයේ පොදු වැසිකිලි පිරිසිදු කරන සේවකයින්

7- සනීපාරක්ෂක සේවකයින්ට උපකාර කිරීමේ ප්‍රතිපත්තිය.

i- සියලුම සනීපාරක්ෂක සේවකයින්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට නොමිලේ වෛද්‍ය සායන පැවැත්වීම මගින් ඔවුන්ට වැලදීඇති රෝගාබාධ හදුනාගැනීමට හා අවශ්‍ය පුතිකාර සඳහා යොමුකිරීමට කටයුතු කිරීම.

ii- සියලුම සනීපාරක්ෂක සේවකයින් සඳහා සෑම වර්ෂයකට වරක් වටිනා බඩුමලු පරිත්‍යාග කිරීම මගින් ඔවුන්ගේ ආර්තිකය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

iii- එම සේවකයින්ගේ සුභසාධනය ඉහල නැන්වීම සඳහා වාර්ෂික විනෝද චාරිකා හා ක්‍රීඩා උත්සව සංවිධානය කිරීම හා ඒ සඳහා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සම්බන්ධ කර ගැනීම.

iv- ආපදා ණය කාර්යය සාධන ණය ලබාදීමේදී ඔවුන් සඳහා ප්‍රමුකතාවය ලබාදීමට කටයුතු කිරීම.

v- සෑම සනීපාරක්ෂක සේවකයෙකුටම මාසිකව සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කිරීම.

vi- සේවයේ යෙදීමේදී තම ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වාර්ෂිකව අවශ්‍ය ආරක්ෂිත උපකරණ කට්ටලයන් ලබාදීමට කටයුතු කිරීම්. හා නිල ඇඳුම් ලබාදීම.

vii- මී උන හා පිට ගැස්ම යන රෝග වලින් වැලැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිජීවක ඖෂධ ලබාදීමට කටයුතු කිරීම.

viii- ඉහල කාර්යාසාධනයක් පෙන්නුම් කරන සේවකයින් ඇගයීම සඳහා සෑම කාර්තුවකට වරක් හොදම සෞඛ්‍ය සේවකයාතේරීම හා ඒ සඳහා වටිනා ත්‍යාග ලබාදීමට කටයුතු කිරීම.

ix- සෑම සෞඛ්‍ය සේවකයෙකුම සුභසාධක සංගමයේ සාමාජිකයන් බවට පත්කරගෙන එහි ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.

x- සනීපාරක්ෂක සේවකයින් සඳහා පුහුනු වැඩසටහන් පැවැත්වීම.

## අයවැයකරණයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1- නගරසභා ආඥා පනතේ 178/1 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා ආදායම් හා වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කරනු ලබයි.ඒ අනුව

i- එක් එක් ආදායම් ප්‍රභවයන් වලින් ඉදිරි වර්ෂයේදී ලබාගැනීමට අපේක්ෂිත ආදායම් ස්තමේන්තු කිරීම.

ii- නගරසභාව විසින් කලයුතු කාර්යන් ඉටුකිරීම සඳහා එක් එක් වියදම් ශීර්ෂයන් යටතේ වැය කිරීමට සිදුවේයැයි අපේක්ෂිතවියදම ඇස්තමේන්තු කිරීම.

2- ඉහත කාර්යයාට ප්‍රදේශයෙ ආර්ථික හා සමාජීය සංස්කෘතික වටිනාකම් වල සම්බන්ධතාවය

බලන්ගොඩ නගරසභා බල ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික කාර්යයා වෙලදාම වේ. එසේම මූල්‍ය සේවා සැපයීමද ප්‍රධාන තැනක් ගනී. ඊට අමතරව සේවා සැපයීමද ආර්ථික ක්‍රියාවලිය තුල සිදුවේ. ඒ අනුව නගර බලප්‍රදේශය තුල සියලුම ආර්ථික ක්‍රියාවලීන් සිදුවේ. අයවැය ඇස්තමේන්තුව තුල ප්‍රධාන ආදායම් ලෙස

i- වරිපනම් බදු
ii- කඩ කුලී
iii- ව්‍යාපාර හා කර්මාන්ත බදු
iv- සේවා සඳහා ගාස්තු ආදිය ඇතුලත්වේ.

නගරසභා බලප්‍රදේශය තුල සිංහල දෙමල මුස්ලිම් ආදී සියළුම ජන කොට්ඨාස වාසය කරන අතර සියළුම සමාජීය හා සංස්කෘතික කටයුතු සිදුවේ. ඒ අනුව ප්‍රධාන වශයෙන් අයවැය තුල පහත කාර්යන් සඳහා ප්‍රතිපාදන සැලසීමට සිදුවේ.

i- කසල කළමනාකරණ කටයුතු හා නගරය පිරිසිදු කිරීම.
ii- පුස්තකාල සේවා පවත්වාගෙන යාම
iii- වීදි ආලෝක කරණ කටයුතු.
iv- මන්මාවත් අළුත්වැඩියා හා නඩත්තු සේවා පවත්වාගෙන යාම
v- රෝග වැලැක්වීමේ සේවා පවත්වාගෙන යාම.

3- අයවැය කරණය සඳහා දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

වරිපනම් හා දීර්ඝකාලීනව බදු ලබාදී ඇති දේපල වලට අදාල කුලී ඇස්තමේන්තු කිරීම තක්සේරු කර ගැසට් කර ඇති මිල ගනන් අනුව  සිදුකරනු ලබයි.අනෙකුත් දේපල සඳහා වන කුලිය ටෙන්ඩර් වටිනාකම් පදනම් කරගෙන ඇස්තමේන්තු කරනු ලබයි. එසේම වියදම් නගරසභා ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල වර්ෂයේ කරනු ලැබීමට අපේක්ෂිත වියදම ඇස්තමේන්තු කරනු ලබයි. ඒ අනුව පුනරාවර්තන අතිරිත්තය අනුව කරනු ලබන ප්‍රාග්ධන වියදම්  ඇස්තමේන්තු කරනු ලබයි.

4- සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා.

පළාත්පාලන ආයතනයකින් ජනතාවට ලැබිය යුතු සේවය මනා ලෙස ලබාදීමට හැකිවන අයුරින් අයවැය පිළියෙල කිරීම හා නගරසභාව කරගෙන ආ කාර්යන් තව දුරටත් ගුනාත්මකව වර්ධනය කර ගැනීමට හැකිවන අයුරින් අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.

5- කාර්ය්‍යා හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

පිළියෙල කරන ලද අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කර සංසෝදන තිබේ නම් සංසෝදනය කර සභාවේ අනුමත කරවා ගැනීම.

6- අදාල කාර්යයා හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

සභාපති හා මන්ත්‍රී වරුන්
නගරසභාවේ නිලධාරීන්
අනෙකුත් රාජ්‍ය ආයතන වල නිලධාරීන්
ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන්
නාගරික ජනතාව

7- අයවැය කරණයට සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

i- අයවැය පිළියෙල කිරීමේදී බලප්‍රදේශයේ සියළුම පාර්ෂවයන් නියෝජනය වන පරිදි යෝජනා හා අදහස් ලබාලැනීමට ක්‍රියා කිරීම.

ඒ අනුව

- ප්‍රදේශයේ අනෙකුත් රාජ්‍යා ආයතන වල අදහස් හා යෝජනා ලබාගැනීම
- ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන වල අදහස් හා යෝජනා ලබාගැනීම
- පුරවැසි කමිටු වල යෝජනා ලබාගැනීම
- තැපැල් මගින් යෝජනා ලබාගැනීම.
- වෙබ් අඩවිය හරහා යෝජනා ලබාගැනීම.

ii- අය වැය ලේඛණය මගින් මුදල් වෙන් කිරීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවයටම සමාන අවස්ථා ලැබෙන පරිදි මුදල් වෙන් කිරීම සිදු කිරීම.

iii- දිළිදුකම පිටු දැකීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාවට නැන්වීමේදී අදාල ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීම

iv- තිරසර සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීමට හා දේශගුනික විපර්යාසයන්ට ඔරොත්තු දෙමින් ආපදා අවදානම අවම කිරීමට හැකිවන අයුරින් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම.

v- දේශගුනික විපර්යාසයන්ට ඔරොත්තු දීම හා ගෝලීය උශ්නත්වය පාලනය සඳහා මුදල් වෙන් කිරීම.

# ජල බවුසරය නොමිලේ ලබාදීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**1-** හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවයන් හා අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා බවුසර් මගින් ජලය ලබාදීම සිදුකෙරේ.එසේ ලබාදෙන මිල ගනන් වාර්ෂිකව ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි. සමහර අවස්ථා වල ආගමික ස්ථාන හා පාසල් වලින් මෙන්ම නාගරික බල ප්‍රදේශයේ ජනතාවද ජල බවුසරය නොමිලේ ඉල්ලුම් කරන අවස්ථා ඇත.

**2-** ප්‍රදේශයේ ආර්ථික සමාජීය හා සංස්කෘතික වටිනාකම්වල සම්බන්ධතාවය.

නාගරික බල ප්‍රදේශයක් වුවද නගරයෙන් බැහැර වන්නට නගර සීමාව තුල පිහිටි නල මගින් ජලය නොලැබෙන ප්‍රදේශද ඇත. එම ප්‍රදේශ වල නියන් කාල වලදී ලින් වල ජලය අඩුවන අතර ජනතාවට ජලය ලබාගැනීමේ ගැටළු ඇතිවේ. එසේම සියළුම ආගම් වලට අදාල පජනීය ස්ථාන නගරය තුල පිහිටා ඇති අතර එම පූජනීය ස්ථාන වල විවිධ සංස්කෘතික උත්සව පවත්වන අවස්ථාද ඇත. නගරයේ ප්‍රධාන පාසල් කිහිපයක්ද පිහිටා ඇති අතර ඒවායේ ක්‍රීඩා උත්සව ආදී විවිධ උත්සව පවත්වන අවස්ථා ඇත.

**3-** දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

ජල බවුසරය ඉල්ලා සිටින අවස්ථා වල අදාල වර්ෂයේ ගැසට් කර ඇති මිල ගනන් අයකර බවුසරය මගින් ජලය ලබාදීම සිදුකෙරේ.

**4-** සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාගැනීමේ ගැටළු මතුවන අවස්ථා වල ජලය ලබාදීම සභාවේ වගකීමක් ලෙස සලකා ක්‍රියා කරයි.

5- කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

සභාවක් පවතින අවස්ථාවල සභා තීරනයක් මත හා සභාවක් නොමැති අවස්ථාවල තීරන කමිටුවේ තීරනය මත ජල බවුසරය ලබාදීමේ මිල ගනන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඒ අනුව අදාල ගාස්තු අයකර ජල බවුසරය ලබාදීම සිදු කරනු ලබයි.

6- අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

i- බල ප්‍රදේශයේ පිහිටි රජයේ පාසල්
ii- බල ප්‍රදේශය තුල ඇති වෙනත් රාජ්‍ය ආයතන
iii- බල ප්‍රදේශය තුල ඇති ආගමික ස්ථාන
iv- බල ප්‍රදේශය තුල ඇති නල ජලය නොමැති ගම්මාන වල ජනතාව.

7- ජල බවුසරය නොමිලේ ලබාදීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

ප්‍රදේශයේ රාජ්‍ය ආයතන , රජයේ පාසල් හා ආගමික ස්ථාන වල විශේෂ උත්සව පවත්වන අවස්ථා වලදී නොමිලේ ජල බවුසරය ඉල්ලා ඇති අවස්ථාවක සභා තීරනයක් මත හා සභාවක් නොමැති අවස්ථා වලදී තීරන කමිටුවේ තීරනයක් මත සහනදායී මුදලට ජල බවුසරය ලබාදීම සිදුකෙරේ.

නියත් කාලයක් පවතින අවස්ථා වලදී ප්‍රාදේශීය සංවර්ධන කමිටු යෝජනා මත හෝ ජනතාවගේ ඉල්ලීම මත සභාවේ හෝ තීරන කමිටුවේ තීරනය මත ජල බවුසරය නොමිලේ ලබාදීම සිදුකෙරේ.

## සති පොළ සදහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1-හැදින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ එළවලු පලතුරු හා අනෙකුත් පාරිභෝගික භාංඩ ලබාගැනීම සදහා සෑම සතියකම ඉරිදා දින සතිපොල පවත්වාගෙන යාම හා එහි නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.

2-ප්‍රදේශයේ ආර්ථික සමාජීය හා සංස්කෘතික වටිනාකම්වල සම්බන්ධතාවය.

නාගරික බල ප්‍රදේශයක් වුවද නගරයෙන් බැහැර වන්නට කෘෂිකාර්මික ආර්ථිකයක් සහිත බල ප්‍රදේශයකි. එසේම ස්වයන් රැකියාවක් ලෙස සුළු පරිමාන වෙළදාම් කටයුතු කරන පිරිසක්ද සිටින ප්‍රදේශයකි.

3-දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

සතියේ සෑම ඉරිදා දිනකම සතිපොල පවත්වන අතර පොල භූමියේ වෙළදාම් කරන අයගෙන් දිනකට ගාස්තුවක් අය කරනු ලබයි.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

ප්‍රදේශයේ ජනතාවට සහනදායී මිලට එලවළු එලතුරු හා පාරිභෝගික ද්‍රව්‍ය ලබාදීම සදහා ඉඩ ප්‍රස්ථා සැලසීම .එසේම පොල භූමිය නිසියාකාරයෙන් නඩත්තු කිරීම හා පිරිසිදු කිරීමේ කටයුතු පවත්වාගෙන යාම.

5-කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

සභාවක් පවතින අවස්ථාවල සභා තීරනයක් මත හා සභාවක් නොමැති අවස්ථාවල තීරන කමිටුවේ තීරනය මත පොල භූමියේ මඩුවක් ලබාදීමේ මිල ගනන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

6-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

i- පොල භූමියේ වෙදාම් කරන වෙළදුන්
ii- බල ප්‍රදේශයේ මහ ජනතාව
iii- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය
iv- ටෙන්ඩර් කරුවන්
v- සනීපාරක්ෂක සේවකයින්

7-සති පොල සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

- i- ඉරිදා දිනය පොහොය දිනයක් වන අවස්ථාවක සතිපොල පැවැත්වෙන දිනය සඳහා ඊට පෙර දිනය වන සෙනසුරාදා දිනය ආදේශ කර ගැනීම.
- ii- පොල මඩු තුල වෙළදාම් කරනු ලබන ආබාදිත අය සඳහා සහ වැඩිහිටි අය සඳහා සහන ගාස්තුවක් අය කිරීම.
- iii- කාන්තා නිෂ්පාදන අලෙවිය සඳහා හා වෙලෙදාම් කරන කාන්තාවන් සඳහා ප්‍රමුකතාවය ලබා දීම.
- iv- සතිපොල නොමැති අවස්ථා වලදී පොල භූමිය වෙනත් ආර්ථික කටයුතු සඳහා ලබාදීමට කටයුතු කිරීම.
- v- සිංහල හා හින්දු අලුත් අවුරුදු සමයේදී අප්‍රෙල් මස 9 වන දින සිට 12 වන දින දක්වා ප්‍රධාන පොල පැවැත්වීමට කටයුතු කිරීම.
- vi- ප්‍රාදේශීය ව්‍යවසායකයන්ගේ නිශ්පාධන අළෙවිය සඳහා පොල භූමියේ අවස්තාථාව සලසාදීම.

## අවිධිමත් ජනාවාස නියාමනය  සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1-හැඳින්වීම

නගරසභා බල ප්‍රදේශය තුල නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන අයුරින් ඉදිකරන ලද නිවාස පිහිටි ජනාවාස පවතී. එම ජනාවාස වල නිවාස කුඩා ඉඩම් කැබලි වල පිහිටා ඇති අතර විධිමත් පිවිසුම් මාර්ගද නොමැත.එසේම අප ජලය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමයක්ද සුදුසු වැසිකිලි පහසුකම්ද නැත.

2- අවිධිමත් ජනාවාස වල ආර්ථික සමාජීය තත්වය.

ඉහත සඳහන් ජනාවාස වල ජනතාවට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති අතර ඉතා අඩු ආර්ථික මට්ටමක් සහිත ජනතාවකි. එසේම ඔවුන්ගේ සමාජ මට්ටමදසතුටුදායක මට්ටමක නොමැත.

3-දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

නගර සභා බල ප්‍රදේශයේ නිවසක් ඉදිකිරීමේදී අදාල ඉඩම අවම වශයෙන් පර්චස් 6 ක් තිබිය යුතුය. එසේම මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයක සිට නිවසට දුර අඩි 50 ක් තිබිය යුතු අතර නගර සභා මාර්ගය සිට දුර අඩි 20 ක් තිබිය යුතුය. එසේම ඉඩමේ මායිමේ සිට නිවසට දුර අඩි 7.5 තිබිය යුතුය. නිවසට පිවිසුම් මාර්ගය පලල අවම වශයෙන්  අඩි 10 ක් තිබිය යුතුය.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

අවිධිමත් ජනාවාස වල ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම නගර සභාවේ වගකීමක් වේ. ඒ අනුව ඔවුන්ට ජලය හා විදුලිය ලබාගැනීමට අවස්ථාව ලබාදීම, කසල එකතුකිරීමේ කටයුතු, සනීපාරක්ෂක කටයුතු අධීක්ෂනය, බෝවන රෝග පාලනයට කටයුතු කිරීම ආදිය කලයුතු වේ.

5-කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

නගර සභා බල ප්‍රදේශය තුල නිවසක් ඉදිකිරීමේදී ඉහත 3 හි සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතු අතර ඉදිකිරීමට යෝජිත ඉඩමේ සැලැස්ම නගරසභාවේ සැලසුම් කමිටුව අනුමත කරවා ගත යුතුය.

6-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

- i- අවිධිමත් ජනාවාස වල ජනතාව
- ii- නගරසභාව
- iii- නාගරික සංවර්ධන අධිකාරිය
- iii- මාර්ග සංවර්ධන අධිකාරිය
- iv- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය

7-අවිධිමත් ජනාවාස නියාමනය සදහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

නිවසක් ඉදිකිරීමේදී ඉඩමේ ප්‍රමානය පර්චස් 6 ට අඩුවන අවස්ථා වල ඉඩම් කිහිපයක් ඒකාබද්ධ කර නිවාස සැලසුම් අනුමැතියට යොමු කරවීමට කටයුතු කිරීම.

වැසිකිලි ලහසුකම් ඉදිකර ගැනීම සදහා ඉඩ කඩ නොමැති අවස්ථා වල නිවාස කිහිපයක් සදහා එක් වැසිකිලියක් ඉදිකර ගැනීමට යොමුකරවීමට කටයුතු කිරීම.

ජලය සහ විදුලිය ලබාගැනීමේදී අශ්‍යතා සපුරා නොමැති අවස්ථාවල ජලය හා විදුලිය ලබාගැනීම සදහා වන ජල හා විදුලි සහතික වෙනුවට ජලය හා විදුලිය ලබාගැනීමට විරුද්දත්වයක් නොමැති බවට අදාල ආයතන වෙත ලිපි යොමු කිරීම.

## ක්‍රීඩා පිටිය ලබාදීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1-හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ හා ආයතන වල ක්‍රීඩා අවශ්‍යතා හා අනෙකුත් උත්සව අවස්ථා සඳහා ක්‍රීඩා පිටිය ලබාදීම සිදු කෙරේ. සමහර අවස්ථා වල රජයේ ආයතන හා පාසල් වලින් ක්‍රීඩා පිටිය නොමිලේ ඉල්ලා සිටින අවස්ථා ඇත.

2-ප්‍රදේශයේ ආර්ථික සමාජීය හා සංස්කෘතික වටිනාකම්වල සම්බන්ධතාවය.

නගරය ආසන්නයේ ප්‍රධාන රාජ්‍ය ආයතන හා පාසල් විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. පාසල් බොහෝමයක පාසල් භූමිය ඉතා කුඩා වන අතර විශාලත්වයෙන් යුතු ක්‍රීඩා පිටිද පිහිටා නොමැත. එසේම නාගරික ජනතාව වාසය කරන නිවාසද කුඩා ඉඩම් වල පිහිටා ඇත. එනිසා පාසල් රජයේ ආයතන හා ප්‍රදේශයේ ජනතාවද නාගරික ක්‍රීඩා පිටිය පරිහරනය කරන අවස්ථා ඇත.

3-දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

ක්‍රීඩා පිටිය ඉල්ලා සිටින අවස්ථා වල වාර්ෂිකව ගැසට් කර ඇති මිල ගනන් අයකර ලබාදිම.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

ප්‍රදේශයේ ජනතාවට හා ආයතන වලට ක්‍රීඩා හා අනෙකුත් අවශ්‍යතා සඳහා ක්‍රීඩා පිටිය ලබාදීම හා ක්‍රීඩා පිටිය නිසිආකාරයෙන් නඩත්තු කර පවත්වාගෙන යාම.

5-කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

සභාවක් පවතින අවස්ථාවල සභා තීරනයක් මත හා සභාවක් නොමැති අවස්ථාවල තීරන කමිටුවේ තීරනය මත ක්‍රීඩා පිටිය ලබාදීමේ මිල ගනන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

6-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

- i- නගරයේ හා ආසන්නයේ පිහිටා ඇති රජයේ ආයතන
- ii- නගරය තුල පිහිටා ඇති රජයේ පාසල්
- iii- නාගරික ජනතාව
- iv- ව්‍යාපාරික ආයතන
- v- ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ

7-ක්‍රීඩා පිටිය ලබාදීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

ප්‍රදේශයේ පාසල් හා රාජ්‍ය ආයතන වල විශේෂ උත්සව හා ක්‍රීඩා කටයුතු සඳහා ක්‍රීඩා පිටිය නොමිලේ ඉල්ලා සිටින අවස්ථා වල වාර්ෂිකව ගැසට්කර ඇති ගාස්තුවෙන් අඩක් අය කර ක්‍රීඩා පිටිය ලබාදීම.

ක්‍රීඩා හා අනෙකුත් උත්සව අවස්ථාවන් සඳහා ක්‍රීඩා පිටිය ඉල්ලා සිටින අවස්ථාවන් වලදී ක්‍රීඩා පිටියට හා ප්‍රේක්ෂකාගාරයට සිදුවන හානි හා විදුලිය භාවිතා කිරීමේදී අය කිරීම සඳහා රු.5,000.00 ක ආරක්ෂිත ඇප තැන්පත් මුදලක් තබා ගැනීම හා.

## අවිධිමත් ජනාවාස නියාමනය සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1-හැඳින්වීම

නගරසභා බල ප්‍රදේශය තුල නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන අයුරින් ඉදිකරන ලද නිවාස පිහිටි ජනාවාස පවතී. එම ජනාවාස වල නිවාස කුඩා ඉඩම් කැබලි වල පිහිටා ඇති අතර විධිමත් පිවිසුම් මාර්ගද නොමැත.එසේම අප ජලය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමයක්ද සුදුසු වැසිකිලි පහසුකම්ද නැත.

2- අවිධිමත් ජනාවාස වල ආර්ථික සමාජීය තත්වය.

ඉහත සඳහන් ජනාවාස වල ජනතාවට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති අතර ඉතා අඩු ආර්ථික මට්ටමක් සහිත ජනතාවකි. එසේම ඔවුන්ගේ සමාජ මට්ටමදසතුටුදායක මට්ටමක නොමැත.

3-දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

නගර සභා බල ප්‍රදේශයේ නිවසක් ඉදිකිරීමේදී අදාල ඉඩම අවම වශයෙන් පර්චස් 6 ක් තිබිය යුතුය. එසේම මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයක සිට නිවසට දුර අඩි 50 ක් තිබිය යුතු අතර නගර සභා මාර්ගය සිට දුර අඩි 20 ක් තිබිය යුතුය. එසේම ඉඩමේ මායිමේ සිට නිවසට දුර අඩි 7.5 තිබිය යුතුය. නිවසට පිවිසුම් මාර්ගය පලල අවම වශයෙන් අඩි 10 ක් තිබිය යුතුය.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

අවිධිමත් ජනාවාස වල ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම නගර සභාවේ වගකීමක් වේ. ඒ අනුව ඔවුන්ට ජලය හා විදුලිය ලබාගැනීමට අවස්ථාව ලබාදීම, කසල එකතුකිරීමේ කටයුතු, සනීපාරක්ෂක කටයුතු අධීක්ෂනය, බෝවන රෝග පාලනයට කටයුතු කිරීම ආදිය කලයුතු වේ.

5-කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

නගර සභා බල ප්‍රදේශය තුල නිවසක් ඉදිකිරීමේදී ඉහත 3 හි සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතු අතර ඉදිකිරීමට යෝජිත ඉඩමේ සැලැස්ම නගරසභාවේ සැලසුම් කමිටුව අනුමත කරවා ගත යුතුය.

6-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

v- අවිධිමත් ජනාවාස වල ජනතාව
vi- නගරසභාව
iii- නාගරික සංවර්ධන අධිකාරිය
vii- මාර්ග සංවර්ධන අධිකාරිය
viii- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය

7-අවිධිමත් ජනාවාස නියාමනය සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

i- නිවසක් ඉදිකිරීමේදී ඉඩමේ ප්‍රමානය පර්චස් 6 ට අඩුවන අවස්ථා වල ඉඩම් කිහිපයක් ඒකාබද්ධ කර නිවාස සැලසුම් අනුමැතියට යොමු කරවීමට කටයුතු කිරීම.

ii- වැසිකිලි ලහසුකම් ඉදිකර ගැනීම සඳහා ඉඩ කඩ නොමැති අවස්ථා වල නිවාස කිහිපයක් සඳහා එක් වැසිකිලියක් ඉදිකර ගැනීමට යොමුකරවීමට කටයුතු කිරීම.

iii- ජලය සහ විදුලිය ලබාගැනීමේදී අශාතා සපුරා නොමැති අවස්ථාවල ජලය හා විදුලිය ලබාගැනීම සඳහා වන ජල හා විදුලි සහතික වෙනුවට ජලය හා විදුලිය ලබාගැනීමට විරුද්දත්වයක් නොමැති බවට අදාල ආයතන වෙත ලිපි යොමු කිරීම.

**සුසාන භූමි/ මිහිදන් උයන් සදහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය**

1-හැදින්වීම

සුසාන භූමි පවත්වාගෙන යාම නගරසභාවේ වගකීමක් වේ.ඒ අනුව සුසානභූමි නඩත්තු කටයුතු , මියයන පුද්ගලයින් මිහිදන් කිරීමට අවශ්‍ය කටයුතු සලසාදීම නගර සභාව විසින් සිදුකරනු ලබයි.

2- ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික සමාජීය තත්වය.

නගරසභා බල ප්‍රදේශයේ ආර්ථික වශයෙන් දියුනු මට්ටමක සිටින ජනතාව හා දිලිදු මට්ටමින් සිටින ජනතාවද ජීවත් වේ. එසේම ප්‍රදේශයේ වැඩිහිටි නිවාසද පිහිටා ඇත.නගර සීමාව තුල රෝහලද පිහිටා ඇති අතර එහි භාරකරුවන් නොමැති පුද්ගලයින් මිය යන අවස්ථාද ඇත.

3- සුසාන භූමි පවත්වාගෙන යාමට දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

නගර සභාව විසින් පවත්වාගෙ යන සුසාන භූමි වල සිරුරු මිහිදන් කිරීම සදහා නගර සභාවේ අවසරය ලබාගත යුතු අතර ඒ සදහා වාර්ෂිකව ගැසට් කරන මුදලක් අයකිරීම සිදුවේ.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

සභා විසින් පවත්වාගෙන යන සුසාන භූමි නිසියාකාරව නඩත්තු කිරීම හා සුසාන භූමිය ප්‍රයෝජනයට ගන්නා ජනතාවට පහසුවෙන් පරිහරනය කල හැකි අයුරින් පිරිසිදුව තබාගැනීම. මිහිදන් කරන පුද්ගලයින්ගේ අනන්‍යතාවය සහතික කරවා ගැනීම.

5-කාර්යය හා කර්තව්‍ය කිරීමේදී අනුගමනය කල යුතු නීතියේ අවශ්‍යතාවය.

i- මිය ගිය පුද්ගලයාගේ විස්සර ඇතුලත් අයදුම්පත සම්පුර්න කිර භාර දීම.
ii- මරණ සහතිකය හෝ ග්‍රාම නිළධාරී සහතිකය ලබාගැනීම.
iii- මියගිය පුද්ගලයාගේ ජාතික හැදුනුම් පතෙහි පිටපතක් ලබාගැනීම.
iv- මිහිදන් කිරීම සදහා නගරසභාවේ අවසර පත්‍රය නිකුත්කිරීම.
v-

6-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

i- ප්‍රදේශයේ ජනතාව
ii- සුසානභූමි භාර කරුවන්
iii- ග්‍රාම නිලධාරීන්

7-සුසාන භූමි පවත්වාගෙන යාම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

i- මියගිය අයගේ දේහයන් මිහිදන් කිරීම සඳහා ගාස්තු අයකිරීමකින් තොරව අවස්ථාව ලබාදීම

ii- සුසාන භූමි වටාඇති තාප්පය මත විශේෂිත කුටි ඉදිකර එහි මියගිය අයගේ අළු තැන්පත් කිරීම සඳහා ගාස්තු අයකර අවස්ථාව ලබාදීම.

iii- බලන්ගොඩ නගරයේ ඇති වැඩිහිටි නිවාස වල මිය යන පුද්ගලයින් මිහිදන් කිරීම සඳහා පහසුකම් සලසාදීම.

iv- බලන්ගොඩ නගරයේ භාරකරුවකු නොමැති පුද්ගලයෙකු මිය ගිය අවස්ථා වලදී නීත්‍යානුකූල භාවය තහවුරු කරගැනීමෙන් අනතුරුව සුසාන භූමියේ මිහිදන් කිරීම සඳහා පහසුකම් සලසා දීම.

## අවිධිමත් ව්‍යාපාර නියාමනය සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

1-හැදින්වීම

නගරසභා සීමාව තුල විධිමත් ආකාරයෙන් තොරව යම් යම් ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථා ඇත.ඒ අනුව සංචාරක වෙළෙදාම, පදික වේදිකා මත කරන වෙලළදාම හා මාර්ගයේ අයින්වල වාහන වල තබාගෙන වෙළෙදාම් කිරිම ආදිය සිදු කරනු ලබයි.

2- අවිධිමත් වෙළෙදුන්ගේ ආර්ථික හා සමාජීය තත්වය.

අවිධිමත් ආකාරයෙන් වෙළෙදාම් කරනු ලබන පුද්ගලයින්ගේ ආර්ථිකය ඉතා අඩු මට්ටමක පවතින අතර සෑම දිනකම ඒකාකාර ආදායමක් නොලබයි. එසේම ඉහත වෙළෙදාමේ නිරත වන්නන් අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයින් වන අතර දිලිදු බවින් පෙලෙන්නන්ද වෙති.

3- අවිධිමත් වෙළෙදුන් සඳහා දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

අවිධිමත් වෙළෙදාමේ නිරත වන්නන් මහජනතාව පීඩාවක් වන අවස්ථා වල ඉවත් කිරීමට කටයුතු කිරිම හා ඔවුන්ට විකල්ප ස්ථාන ලබාදී නගර සභාවට කුලියක් ලබාගැනීමට කටයුතු කිරීම.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

i- අවිධිමත් වෙළෙදාම මහජනතාවට පීඩාවක් නොවන අයුරින් පවත්වාගෙන යාමට පහසුකම් සලසාදීම.
ii- අවිධිමත් වෙළෙදුන් සඳහා සුදුසු ස්ථාන ලබාදීමට කටයුතු කිරීම.
iii- පාරිභෝගිකයින්ට සෞඛ්‍ය ආරක්ෂිත භාන්ඩ හා සේවා ලබාදීමට අවස්ථාව සලසාදීම.
iv- අඩු ආදායම් ලාභීන්ගේ ආර්ථිකය නන්වාලීමට කටයුතු කිරීම.

5-අදාල කාර්ය් හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

i- අවිධිමත් වෙළෙදාමේ නිරතවන්නන්
ii- පාරිභෝගිකයින්
iii- මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්
iv - ආරක්ෂක අංශ

6-අවිධිමත් ව්‍යාපාර නියාමනය සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

i- අනවසර පදික වෙළෙඳුන් සඳහා සුදුසු ස්ථාන ලබාදීමට කටයුතු කිරීම හා ඒ වෙනුවෙන් මාසික කුලියක් අයකිරීමට කටයුතු කිරීම

ii- අවිධිමත් ව්‍යාපාර නියාමනය කිරීමේදී ඔවුන්ගේ දරිද්‍රතාවය සලකා බලා එයින් මුදවා ගැනීමට කටයුතු කිරීම

iii- අවිධිමත් ව්‍යාපාර සඳහා ස්ථාන ලබාදීමේදී කාන්තා මූලික පවුල් සඳහා ප්‍රමුකතාවය ලබාදීම.

iv- ආබාධිත අය සහ ආබාධිත දරුවන් සිටින පවුල් සඳහා ව්‍යාපාරික අවස්ථා හඳුන්වා දී අළෙවිය සඳහා පහසුකම් සලසාදීම.

**වරප්‍රසාද නොලත් කන්ඩායම් වලට ව්‍යතිරේක විධිවිධාන සැලසීමට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තිය**

1-හැදින්වීම

නගරය පරිහරනය කරන්නන් හා නගර සීමාව තුල පදිංචි කරුවන් අතර වරප්‍රසාද නොලත් පුවැසියන්ද වේ. ඒ අතර ජ්‍යේෂ්ඨ පුරවැසියන්, ආබාධිත පුරවැසියන්, අවතැන් වූවන්, අවිධිමත් පදිංචි කරුවන් හා අවිධිමත් ව්‍යාපාර වල නිරතවන්නන්ද සිටී.

2- වරප්‍රසාද නොලත් ජනතාවගේ ආර්ථික සමාජීය තත්වය.

විශේෂයෙන් වරප්‍රසාද නොලත් ජ්‍යේෂ්ඨ පුවැසියන් අතර ඉහල අධ්‍යාපනයක් හා මනා සමාජ අත්දැකීමක් ඇති අය සිටී. එහෙත් අනෙකුත් වරප්‍රසාද නොලත් කණ්ඩායම් වල ජනතාවගේ ආර්ථික මට්ටම සතුටුදායක නොවන අවස්ථාද ඇත.

3- වරප්‍රසාද නොලත් ජනතාව වෙනුවෙන් දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තිය.

ආබාධිත පුද්ගලයින් නගරසභාවේ සේවා ලබාගැනීමට පැමිනේමේදී ඔවුන්ට පහසුවෙන් කාර්යාලයට ඇතුල්විය හැකි පරිදි ආබාදිත පිවිසුමක් සකස්කර තිබීම. ආබාධිත අයට සේවා ලබාදීමේදී ප්‍රමුකතාවය ලබාදීම.

4-සභාව පාර්ෂවයෙන් සම්පූර්න කලයුතු අවශ්‍යතා

i- වරප්‍රසාද නොලත් කණ්ඩායම් වලට නගරසභාවේ සේවා ලබාදීමේදී සමාන ලෙස සැලකීම.

ii- වරප්‍රසාද නොලත් කණ්ඩායම් වලආර්ථික හා සමාජ තත්වය වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම

Iii - වරප්‍රසාද නොලත් කණ්ඩායම් පිළිගැනීමට ලක්වන වැඩසටහන් පැවැත්වීම.

5-අදාල කාර්යය හා සම්බන්ද වන පාර්ෂව කරුවන්.

i- ජ්‍යේෂ්ඨ පුරවැසියන්
ii- ආබාදිත පුරවැසියන්
iii- අවතැන් වූවන්

iv - අවිධිමත් පදිංචි කරුවන්

iv- අවිධිමත් ව්‍යාපාරිකයින්

**7- වරප්‍රසාද නොලත් කන්ඩායම් වලට ව්‍යතිරේක විධිවිධාන සැලසීමට සදහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය**

*නගර සභාවේ පහත සදහන් කමිටු සදහා ජේෂ්ඨ පුරවැසියන් සහභාගී කර ගැනීම.

i- පුස්තකාල උපදේශක කමිටුව
ii- අයවැය පිළියෙල කිරීමේ පුරවැසි කමිටුව

* පොල භූමිය තුල වෙළෙඳාම් කරන ආබාධිත අය හා වැඩිහිටි පුද්ගලයින් සදහා සහන ගාස්තු අයකිරීම

* අවිධිමත් පදිංචිකරුවන් සදහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම

i- නිවසක් ඉදිකිරීමේදී ඉඩමේ ප්‍රමානය පර්චස් 6 ට අඩුවන අවස්ථා වල ඉඩම් කිහිපයක් ඒකාබද්ධ කර නිවාස සැලසුම් අනුමැතියට යොමු කරවීමට කටයුතු කිරීම

ii- වැසිකිලි ලහසුකම් ඉදිකර ගැනීම සදහා ඉඩ කඩ නොමැති අවස්ථා වල නිවාස කිහිපයක් සදහා එක් වැසිකිලියක් ඉදිකර ගැනීමට යොමුකරවීමට කටයුතු කිරීම.

iii- ජලය සහ විදුලිය ලබාගැනීමේදී අශාතා සපුරා නොමැති අවස්ථාවල ජලය හා විදුලිය ලබාගැනීම සදහා වන ජල හා විදුලි සහතික වෙනුවට ජලය හා විදුලිය ලබාගැනීමට විරුද්දත්වයක් නොමැති බවට අදාල ආයතන වෙත ලිපි යොමු කිරීම.

*ස්භාවික විපත් වලදී අවතැන්වූවන් සදහා සහන සැලසීමට ක්‍රියා කිරීම